# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/2/9/1/DO – XV | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.08. 12 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු/ සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දකුණු පළාත.

**2021.12.23 දිනැති අංක 03/2021 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ඒකාබද්ධ සේවය යටතේ පත්වීම් ලද සංවර්ධන නිලධාරීන්ගේ ඉල්ලීම අනුව දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP/PSC/පරි.නි(2021) හා 2022.08.03 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින් යොමු කරන ලද, ඒකාබද්ධ සේවය යටතේ පත්වීම් ලද සංවර්ධන නිලධාරීන්ගේ ඉල්ලීම අනුව දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම සඳහා ගරු ආණ්ඩුකාරවර විසින් 2022.07.26 දාතමින් අනුමත කරන ලද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2022 හි පිටපතක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

03. ඒ අනුව, එම චක්‍රලේඛය සම්බන්ධයෙන් ඔබ යටතේ ඇති ආයතන ප්‍රධානීන් සහ නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණික ව දන්වා සිටිමි.

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2022

මගේ අංකය :SP/PSC/පරි.නි.
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
06 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

2022.06. 27

දකුණු පළාත්
ප්‍රධාන ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත

**<u>2021.12.23 දිනැති අංක 03/2021 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ඒකාබද්ධ සේවය යටතේ පත්වීම් ලද සංවර්ධන නිලධාරීන්ගේ ඉල්ලීම අනුව දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ 2021.12.23 දිනැති අංක 03/2021 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා බැඳේ.

02. ඒ අනුව ඒකාබද්ධ සේවය යටතේ පත්වීම් ලැබ සිටින සංවර්ධන නිලධාරියකු විසින් දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරුවීම සඳහා අපේක්ෂා කරනු ලබන අවස්ථාවකදී ඇමුණුම 1හි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව අයදුම්පත්‍රයක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් මඟින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය. එම අයදුම්පත්‍රය සමඟ ආයතන ප්‍රධානියා විසින් සහතික කල ඇමුණුම් 2හි දැක්වෙන ලේඛනවල පිටපත්ද, අදාළ ඇමුණුම් අනුපිළිවෙල අනුව සකසා ඉදිරිපත් කල යුතුය.

03. දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරකට ස්ථාන මාරුවීම සඳහා අපේක්ෂා කරනු ලබන, ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ පත්වීම් ලැබ සිටින නිලධරයෙකු පහත කොන්දේසිවලට එකඟ විය යුතු අතර ඒ බවට ශ්‍රී ලංකාව තුළ වලංගු දිවුරුම් ප්‍රකාශයක් (ඇමුණුම 03 ප්‍රකාරව) ඉදිරිපත් කළ යුතුය.

I. දකුණු පළාත් රාජ්‍ය සේවයට අයත් සංවර්ධන නිලධාරී සේවයේ පත්වීමක් ලද හොත් පළාතේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට එකඟවන බවට

II. ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරී සේවයේ පත්කර / උසස්කර ඇති ශ්‍රේණියට අනුරූප දකුණු පළාත් සේවයට අයත් සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව දැනට සිටින නිලධාරීන් සියලු දෙනාට පසුව ජ්‍යෙෂ්ඨත්වයේ තැබීමට එකඟ බවටද

III. දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ වන සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අනුකූල වන ශ්‍රේණිගත උසස්වීම් වලට අනුරූපී උසස්වීමක් හැර ඒකාබද්ධ සේවයේ ලබා ඇති ශ්‍රේණිගත උසස්වීම් අත්හැර දැමීමට සිදුවුවහොත් එම උසස්වීම් අත්හැර දැමීමට එකඟවන බවට

IV. ඒකාබද්ධ සේවය යටතේ ලබමින් සිටින වැටුප හා පළාත් රාජ්‍ය සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයට පත් කරනු ලබන ශ්‍රේණියට අනුරූප වැටුප අතර කිසියම් පරස්පරතාවයක් වේ නම් දකුණු පළාත් රාජ්‍ය සේවයට අයත් සංවර්ධන නිලධාරී සේවයේ සමාන්තර නිලධරයෙකු ලබන වැටුපේ පිහිටුවීමට එකඟවන බවට

ගා/SP/1/1/2/2022
2022/07/26
06
2022/07/25

04. මෙහිදී නිලධරයා දකුණු පළාත් රාජ්‍ය සේවයට අයත් සංවර්ධන නිලධාරී සේවයේ තනතුරකට පත්කළහොත් සේවය කිරීමට මනාපය පළ කරන සේවා ස්ථානය පිළිබඳ අයදුම්පත්‍රයේ සඳහන් කල යුතු නමුත් කිසිදු පුරප්පාඩු ලිපියක් ඉදිරිපත් නොකළ යුතුය. එසේම කිසිදු ආයතන ප්‍රධානියෙකු දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිඛිත දැනුවත් කිරීමක් නොමැතිව ඒකාබද්ධ සේවයේ නිලධාරියෙකු තම ආයතනයේ පවතින සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩුවකට අනුයුක්ත කිරීම සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් නොකළ යුතුය.

05. නිලධාරියා දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ වන සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක සේවය කිරීමට මනාපය පළ කරනු ලබන සේවා ස්ථානයේ පුරප්පාඩු පවතීද යන්න පිළිබඳව ප්‍රධාන ලේකම් වෙතින් තහවුරු කර ගන්නා අතර පවතින පුරප්පාඩු අනුව එම තනතුරට නිලධරයා පත් කිරීම සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් තීරණය කරනු ලැබේ. එකී තීරණය මත නිලධාරයා ඒකාබද්ධ සේවයෙන් මුදා හැරීම/නොකිරීම සම්බන්ධ කටයුතු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරනු ඇත.

06. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් නිලධරයා දකුණු පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී තනතුරකට පත් කිරීමට එකඟත්වය පල කරනු ලබන අවස්ථාවකදී, එම නිලධරයා ඒකාබද්ධ සේවය යටතේ වන සංවර්ධන නිලධාරී සේවයෙන් මුදා හැරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය ලබාදෙන්නේ නම් නිලධරයා නව සේවා ස්ථානයේ වැඩ භාර ගන්නා දින සිට ක්‍රියාත්මක වන පරිදි දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් නිලධරයා දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරකට පත් කරනු ලබන එකඟත්වය මාසයක කාලයක් සඳහා පමණක් වලංගු වනු ලැබේ.

07. ඒකාබද්ධ සේවයෙන් මුදාහළ පසු එම නිලධරයා වහාම දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත වාර්තා කර දකුණු පළාත් රාජ්‍ය සේවයට අයත් සංවර්ධන නිලධාරී තනතුරක වැඩ භාරගත යුතුය. වැඩ භාරගත් පසු මෙම නිලධාරීන් දකුණු පළාත් රාජ්‍ය සේවය වෙත අන්තර්ග්‍රහණය කිරීම සඳහා මාස 03 ක් ඇතුලත අදාල අමාත්‍යාංශ ලේකම් මගින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් හරහා අන්තර්ග්‍රහණ අයදුම්පත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත යොමු කල යුතු අතර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් අන්තර්ග්‍රහණයට අදාල ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

ගාමිණී වීරවික්‍රම
ලේකම්
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගාමිණී වීරවික්‍රම
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

2022/07/26

2022/07/28

ඇමුණුම 01

ඒකාබද්ධ සේවය යටතේ පත්වීම් ලැබ සිටින සංවර්ධන නිලධාරීන් දකුණු පළාත් සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරුවීමට අදාල අයදුම් පත්‍රය

1 කොටස - නිලධරයාගේ ඉල්ලීම

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | පෞද්ගලික තොරතුරු | | | | |
| I | නිලධාරියාගේ සම්පූර්ණ නම | | | | |
| II | මුලකුරු සමඟ නම | | | | |
| III | උපන් දිනය | | | | |
| IV | ජාතික හැඳුනුම්පත් අංකය | | | | |
| V | ස්ථිර පදිංචිය | දිස්ත්‍රික්කය - | | | |
| | | ප්‍රා.ලේ. කොට්ඨාශය - | | | |
| VI | තාවකාලික පදිංචිය | දිස්ත්‍රික්කය - | | | |
| | | ප්‍රා.ලේ. කොට්ඨාශය - | | | |
| 02 | සේවා කාලය පිළිබඳ තොරතුරු | | | | |
| I | සේවා ස්ථානය | | | | |
| | මුල් පත්වීම් දිනය | | | | |
| II | සේවය | | | | |
| III | තනතුර | | | | |
| IV | ශ්‍රේණිය | | | | |
| | දැනට ලබන වැටුපට අදාළ කේත අංකය | | | | |
| | මාසික වැටුප | | | | |
| | වැටුප් පියවර | | | | |
| V | පත්වීම ස්ථිර කර තිබේද (සලකුණ යොදන්න) | ඔව් | | නැත | |
| | ස්ථිර කළ දිනය | | | | |
| | පත්වීම ස්ථිර කර නොමැති නම් ඊට හේතු | | | | |
| VI | 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | සම්පූර්ණ කළ දිනය | | | |
| | 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | සම්පූර්ණ කළ දිනය | | | |
| | 3 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | සම්පූර්ණ කළ දිනය | | | |
| VII | දෙවන භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර තිබේද | ඔව් | | නැත | |
| VIII | ශ්‍රේණිගත උසස් කිරීම් ලද දිනය - 11 ශ්‍රේණිය | | | | |
| | ශ්‍රේණිගත උසස් කිරීම් ලද දිනය - 1 ශ්‍රේණිය | | | | |
| 03 | වෙනත් තොරතුරු | | | | |
| I | පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලැබ ඒකාබද්ධ සේවයට මුදා හැර ඇති නිලධාරියකුද යන්න | ඔව් | | නැත | |
| II | එසේ නම් මුදා හරින ලද දිනය | | | | |
| III | ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහණය කළ දිනය | | | | |
| 04 | ස්ථාන මාරුවට අදාල තොරතුරු | | | | |
| I | ස්ථාන මාරුව අපේක්ෂිත දිස්ත්‍රික්කය | ගාල්ල | මාතර | හම්බන්තොට | |
| II | ස්ථාන මාරුව ඉල්ලීමට හේතු | | | | |

දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරක් සඳහා ස්ථානමාරු වීමට අවස්ථාව ලද හොත් එම තනතුරේ වැඩ භාරගත් දින සිට දකුණු පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරමි

.......................... ..............................

දිනය අත්සන

ග/SP/1/1/2/2022
ආණ්ඩුකාරතුමා
2022/07/26
06
2022/07/28

## II කොටස

**ආයතන ප්‍රධානී/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ අමාත්‍යාංශ ලේකම්/ .................................නිර්දේශය**

- ඉහත නිලධාරියා /නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.
- මෙම නිලධාරියා/ නිලධාරිණිය සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග / විගණන විමසුම් හෝ අධිකරණ ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත්, ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂාවක් නොමැති බවත් සනාථ කරමි.
- ඇමුණුම 02 අනුව මෙම නිලධාරියා සම්බන්ධ තොරතුරු හා ලේඛන ඉදිරි කටයුතු සඳහා මේ සමඟ එවන බව කාරුණිකව දන්වමි.

..................................................නිලධාරියා/ නිලධාරිණිය සේවයෙන් නිදහස් කිරීම නිර්දේශ කරමි/ නොකරමි.

..............................

දිනය

.........................................

අත්සන හා නිල මුද්‍රාව

**ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය**

..................................................නිලධාරියා/ නිලධාරිණිය සේවයෙන් නිදහස් කිරීම අනුමත කරමි/ නොකරමි.

..............................

දිනය

.........................................

අත්සන හා නිල මුද්‍රාව

අනුමත අංකය... 41/SP/1/1/2/2022

විසින් 2022/07/26 ....දින අනුමත කොට ඇත

සහතික කරමු. පිටු 06 කි.

2022/07/28

ඇමුණුම 02

| | | | |
|---|---|---|---|
| 1 | නිලධාරියාගේ සම්පූර්ණ නම - | | |
| 2 | නිලධාරියාගේ නම( මුලකුරු සමඟ) - | | |
| 3 | ඒකාබද්ධ සේවය යටතේ නව තනතුරෙහි වැඩ භාරගත් දිනය | | |
| 4 | ඒකාබද්ධ සේවයෙන් මුදා හරින ලද දිනය | | |
| 5 | සංවර්ධන නිලධාරී සේවයට අදාල මුල් පත්වීම් දිනය | | |
| 6 | මුල් පත්වීමට අදාලව වැඩ භාරගත් දිනය | | |
| | (සංවර්ධන නිලධාරී සේවයට ඇතුළත්වීමට පූර්වයෙන් වෙනත් තනතුරක සේවය කර තිබේනම් ඊට අදාල පත්වීම් ලිපි හා වැඩ භාර ගැනීමේ ලිපි අමුණා ඉදිරිපත් කරන්න) | | |
| 7 | පහත ලිපි ලේඛන ඉදිරිපත් කරන්න | ඇත | නැත |
| i | උප්පැන්න සහතිකය | | |
| ii | ජාතික හැඳුනුම්පතෙහි පිටපත | | |
| iii | නමේ වෙනසක් ඇත්නම් දිවුරුම් ප්‍රකාශය/ සංශෝධිත උප්පැන්න සහතිකය | | |
| iv | වෛද්‍ය පරීක්ෂණ වාර්තාව | | |
| v | දිවුරුම හෝ ප්‍රතිඥාව | | |
| vi | වත්කම් හා බැරකම් ප්‍රකාශය | | |
| vii | ගිවිසුම (පොදු160) | | |
| ix | යාවත්කාලීන කරන ලද චර්යා සටහන | | |
| x | උපාධි සහතිකය | | |
| xi | උපාධියට අදාළ විස්තරාත්මක ප්‍රතිඵල සටහන | | |
| xii | උපාධිය විදේශ විශ්ව විද්‍යාලයක නම් වි.වි.ප්‍ර.කො.ස. විසින් පිළිගෙන ඇති බව තහවුරු කෙරෙන ලිපිය | | |
| xiii | විශ්වවිද්‍යාලය විසින් උපාධිය සනාථ කරන ලිපිය | | |
| xiv | 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල සටහන් | | |
| xv | 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල සටහන් | | |
| xvi | 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල සටහන් | | |
| xvii | පත්වීම් ස්ථිර කිරීමේ ලිපිය | | |
| xviii | දෙවන භාෂා ප්‍රවීණතාව ලබා ඇති බව තහවුරු කිරීමට අදාල ලේඛන | | |
| xix | 11 ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය | | |
| xx | 1 ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය | | |
| xxi | විනය ක්‍රියාමාර්ග(අදාල ලේඛන අමුණා ඉදිරිපත් කරන්න) | | |
| xxii | ද්විතියන පදනම මත නිදහස් කිරීම | | |
| xxiii | විදේශ නිවාඩු | | |
| xxiv | වැටුප් රහිත නිවාඩු විස්තර | | |
| xxv | දිවුරුම් ප්‍රකාශය | | |

පරීක්ෂා කර ඉදිරිපත් කරමි

විෂය භාර නිලධාරී -

නම -

අත්සන හා දිනය -

නිවැරදි බව සනාථ කරමි

ආයතන ප්‍රධානී -

අත්සන හා දිනය -

නිල මුද්‍රාව -

ග/5P/1/1/2/2022

2022/07/26

06

2022/07/28

ඇමුණුම 03

## දිවුරුම් ප්‍රකාශය

මෙහි පහත අත්සන් තබන.........................................................................................................( ලිපිනය) දරණ ස්ථානයෙහි පදිංචි ..............................................................(නම) වන මම ගාම්භීර පූර්වකද, අවංකව හා සත්‍යවාදීව පහත සඳහන් කරුණු සහතික කොට දිවුරා ප්‍රකාශ කරමි/ප්‍රතිඥා දෙමි.

1. ඉහත නම සඳහන් ප්‍රකාශක/ ප්‍රකාශිකාව මම වෙමි.
2. මා දැනට ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරි තනතුරක ..............................................(සේවා ස්ථානය) කාර්යාලයේ සේවය කරමි.
3. අදාල චක්‍රලේඛ විධිවිධාන වලට යටත්ව දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ සංවර්ධන නිලධාරි තනතුරකට ස්ථාන මාරුවීමට මා විසින් කරනු ලබන ඉල්ලීමට අනුව මා දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ සංවර්ධන නිලධාරි තනතුරකට පත් කරනු ලැබුවහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2022 හි විධිවිධාන වලට එකඟව දකුණු පළාතේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති බවටත්,
4. පළාත් සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව දැනට සිටින නිලධාරීන් සියලු දෙනාට පසුව ජ්‍යෙෂ්ඨත්වයේ අගට තැබීමට එකඟ බවත්,
5. දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ වන සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවට අනුකූල වන ශ්‍රේණිගත උසස්වීම් වලට අනුරූපී උසස්වීමක් හැර ඒකාබද්ධ සේවයේ ලබා ඇති ශ්‍රේණිගත උසස්වීම් අත්හැර දැමීමට සිදුවුවහොත් එම උසස්වීම් අත්හැර දැමීමට එකඟවන බවටත්,
6. ඒකාබද්ධ සේවය යටතේ සේවයේ සිටියදී ලබමින් සිටින වැටුප හා දකුණු පළාත් රාජ්‍ය සේවය යටතේ සංවර්ධන නිලධාරි සේවයට පත් කරනු ලබන ශ්‍රේණියට අනුරූප වැටුප අතර කිසියම් පරස්පරතාවයක් වේ නම් දකුණු පළාත් සංවර්ධන නිලධාරි සේවයේ සමාන්තර නිලධාරියෙක් ලබන වැටුපේ පිහිටුවීමට එකඟවන බවටත්

මෙයින් දිවුරා ප්‍රකාශ කර සිටිමි/ ප්‍රතිඥා දෙමි.

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව දිවුරා ප්‍රකාශ කරමි./ ප්‍රතිඥා දෙමි.

| මුද්දරය |
|---|

ප්‍රකාශක/ ප්‍රකාශිකාවගේ අත්සන

මෙම දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් කරුණු කියවා තේරුම් කරදීමෙන් අනතුරුව සත්‍ය බවට පිළිගෙන වර්ෂ 20..... ක් වූ ................මස ......................වන දින මා ඉදිරිපිටදී ........................( ස්ථානය) දී අත්සන් තබන ලදී.

..................................................

සාමදාන විනිශ්චයකාර තැන

ග/5P/1/1/2/2022
ආත්ප්‍රකාශනා
2022/07/26
06
2022/07/28